සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, Sethsiripaya ,Battaramulla

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

මගේ අංකය / எனதுஇல / My No: DDD/HO/04/07/S. Village

ඔබේ අංකය / உமது இல / Your No: ..........

දිනය / திகதி / Date: 2016.10.26

**දිවිනැගුම චක්‍රලේඛ අංක:- 2016/11-2**

සියළුම දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් වෙත.

**සමෘද්ධි ආදර්ශ ගම්මාන වැඩසටහන**

උක්ත වැඩසටහන සම්බන්ධයෙන් ඔබ වෙත එවා ඇති මගේ සමාංක හා 2016.07.29 දිවිනැගුම චක්‍රලේඛ අංක 2016/11 හා 2016.09.02 දිනැති ලිපිය හා 2016.09.05 දිවිනැගුම චක්‍රලේඛ අංක 2016/11-1 ට වැඩිමනක් වශයෙනි.

02. 2016.10.24 දින නිල්ලඹ දිවිනැගුම පුහුණු මධ්‍යස්ථානයෙහි දී පැවති සමෘද්ධි ආදර්ශ ගම්මාන ප්‍රගති සමාලෝචන වැඩසටහනේ දී සාකච්ඡාවට බඳුන් වු කරුණු පිළිබඳව සැලකිල්ලට ගෙන ඵලදායී ලෙස ආදර්ශ ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට පහත සංශෝධනයන් සිදු කර ඇත.

i. ජීවනෝපාය ව්‍යාපෘති සඳහා එක් පුද්ගලයෙකු වෙත ලබාදෙන 80% රජයේ උපරිම ප්‍රතිපාදන සීමාව මින් ඉදිරියට රු. 75,000/- ක් වේ.

ii. ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිවල නිරත ආදර්ශ ගම්මානයන්හි සමෘද්ධි හා අඩු ආදායම්ලාභී නොවන අනෙකුත් පවුල් සඳහා ද අත්‍යවශ්‍ය අවස්ථාවන්හි දී පමණක් අදාළ සීමාවන්ට යටත්ව රජයේ දායකත්වය මුල්‍ය පහසුකම් ලබා දිය හැක. මේ සඳහා සමෘද්ධි ආදර්ශ ගම්මාන කමිටුවේ අනුමැතිය ලබා ගන්නේ නම් මැනවි.

iii. සමෘද්ධි ආදර්ශ ගම්මාන තුළ විවිධ සාර්ථක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇති රජයේ සහ වෙනත් රැකියාවල නියුතු ප්‍රතිලාභීන් සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවය පරිදි ජීවනෝපාය චක්‍රීය අරමුදල මගින් ණය පහසුකම් ලබාදීමට කටයුතු කළ හැකිය. වාර්ෂික පොළී අනුපාතය 5% යටතේ උපරිමය රු.ලක්ෂ 05 දක්වා අදාල ඇප කොන්දේසි මත මෙම ණය මුදල් ලබාදිය හැකි අතර මෙය විශේෂ අවස්ථාවක් ලෙස සලකා නව ගිණුම් හිමියන්ට ද ගිණුමේ පරිණත බව නොසළකා එකී ණය මුදල් ලබා දීමට කටයුතු කළ හැක. එහෙත් ණය ලබා දීමේ දී බැංකුව විසින් අනුගමනය කරනු ලබන අනෙකුත් නීති රීති එලෙසම පිළිපැදිය යුතු වේ.

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் தலைமையதிபதி
Director General
011-2883802/2872202
Fax -011-2889002
dg@divineguma.gov.lk

අතිරේක අධ්‍යක්ෂජනරාල්
மேலதிகபணிப்பாளர்தலைமையதிபதி
Additional DirectorGeneral
011-2871672
Fax -011-2887280
adg@divineguma.gov.lk
anuradhakum@yahoo.com

අධ්‍යක්ෂ (පාලන)
பணிப்பாளர்(நிர்வாகம்)
Director (Administration)
011-2873799
Fax -011-2873996
diradmin@divineguma.gov.lk

ප්‍රධාන ගණකාධිකාරී
பிரதான கணக்காளர்
Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

කාර්යාලය
அலுவலகம்
Office
011-2872202
**011- 2887722(Hotline)**

iv. අලෙවි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී එම ව්‍යාපෘති පිළිබඳව නිකුත් කරන ලද අංක 2016/09 හා 2016.06.08 දිනැති දිවිනැගුම අලෙවි සංවර්ධන වැඩසටහන - 2016 චක්‍රලේඛයේ උපදෙස් එලෙසම අනුගමනය කළ යුතුය.

v. යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී උපරිමය රු. මිලි. 02 දක්වා වූ ව්‍යාපෘති අදාළ ගම්මාන සමිති මගින් හෝ ප්‍රදේශයේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වෙනත් පුජා මූල සංවිධාන මඟින් සිදු කරගත යුතු අතර 20% ක ප්‍රජා දායකත්වයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

නීල් හපුහින්න

අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)

පිටපත්:-

1. සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන ගරු අමාත්‍ය එස්.බී. දිසානායක මැතිතුමා - කා.දැ.ගැපි.
2. සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන ගරු නියෝජ්‍ය අමාත්‍ය රංජන් රාමනායක මැතිතුමා - කා.දැ.ගැ.පි.
3. සියළුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන්ලා -කා.දැ.ගැ.ස
4. සියළුම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන්ලා -කා.දැ.ගැ.ස
5. ලේකම්, සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය -කා.දැ.ගැ.ස
6. අතිරේක ලේකම් (දිවිනැගුම), සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය -කා.දැ.ගැ.ස
7. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ.ස
8. ප්‍රධාන ගණකාධිකාරි දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ.ස
9. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ.ස
10. සියළුම අංශ ප්‍රධානීන් , දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව -අ.ක.ස
11. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් -කා.දැ.ගැ.ස හා අ.ක.ස
12. සියළුම දිවිනැගුම මූලස්ථාන කළමණාකරුවන් -අ.ක.ස හා දිවිනැගුම ප්‍රජාමූල බැංකු කළමණාකරුවන් සහ දිවිනැගුම සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා